

වඳවීමේ තර්ජනයට ලක්වෙමින් සත්ව ලෝකය තුළ වඩා වටිනාකමක් හිමි කර ගත් සත්ව විශේෂය ලෙස "ලෝරිස්" හඳුන්වා දිය හැකි. ගැමි ජනයා අතර ඉතාමත් ප්‍රසිද්ධත්වයට පත් වී තිබෙන "ලෝරිස්" ඔවුන්ගේ හැඳින්වීමට අනුව "උණ හපුළුවා" ලෙසින් ආමන්ත්‍රණය කරනු ලබයි.

# දවල් නිදන රෑ නොනිදන "ලෝරිස්"

**චම්මික මල්ලවආරච්චි**

**සත්ව ලෝකය විවිධාකාර ය. එහි විවිධත්වය පරිසරය චමත්කාරජනක ස්ථානයක් බවට පත් කරන්නට ප්‍රබල මෙහෙයක් ඉටු කරනු ලබයි. සත්ව ලෝකයේ ක්ෂිරපායි සතුන් අතරින් විශාලතම සත්වයා පිළිබඳ වාද විවාද නොමැත. එහෙත් ඉතා ම කුඩා නැතහොත් අඟල් 7 - 8 පමණ විශාලත්වයකට හිමිකම් කියන සුන්දර ක්ෂිරපායි සතෙකු පිළිබඳ උදම් අනන්නට හැකියාව ඇත්තේ ලෝකයේ රටවල් පන්සියයකට පමණි.**

එකී රටවල් අතරට පුංචි ශ්‍රී ලංකාව අන්තර්ගත වීම අපට ද පුංචි ආඩම්බරයකි. අනෙක් අතට කුඩා වුවත් සත්ව හා පාරිසරික වශයෙන් ඉතාමත් වටිනා මෙකී කාරණ යි. අතීතයට වඩා අනාගතයේදී වඳවීමේ තර්ජනයට ලක් වී තිබෙන සත්ව කණ්ඩායමක් වශයෙන් ද හැඳින්විය හැකි ය. මෙලෙස වඳවීමේ තර්ජනයට ලක්වෙමින් සත්ව ලෝකය තුළ වඩා වටිනාකමක් හිමි කර ගත් සත්ව විශේෂය ලෙස "ලෝරිස්"(Loris) හඳුන්වා දිය හැකි ගැමි ජනයා අතර ඉතාමත් ප්‍රසිද්ධත්වයට පත් වී තිබෙන "ලෝරිස්" ඔවුන්ගේ හැඳින්වීමට අනුව "උණ හපුළුවා" ලෙසින් ආමන්ත්‍රණය කරනු ලබයි. ගැමියන් හා "උණහපුළුවා" අතර පවත්නා සහ සම්බන්ධතාවන් ගැමි සාහිත්‍යය තුළින් මොනවට පැහැදිලි වේ. එයින් ද, "උණ හපුළුවාගේ කඳුළු " සහ "උණ හපුළුවාගේ පැටවු මෙත්" එහි කියමන් ගැමියන් අතර නූතනයේ ද ජීවමාන කියමන් වේ.

සත්ව විද්‍යාඥයින්ට අනුව මානව පරිණාමය මෙන් "ලෝරිස්" පරිණාමය ද ඉතාම ඈත අතීතයට නැදෑකම් කියන්නකි. පොදුවේ ප්‍රාථමික ක්ෂිරපායි සතුන් සත්ව විද්‍යාත්මකව "ලෙමූර්" (Lemur) යන පොදු නාමයෙන් හඳුන්වනු ලබයි. මෙලෙස ප්‍රාථමික ක්ෂිරපායි සතුන් හැඳින්වීම සඳහා උත්සාහ ගැනීමට හේතු කිහිපයකි. මොවුන් ඉතාමත් නිශ්ශබ්ද සේ ම ගමන් කරන විට කිසිදු හඬක් නොනැගීම ප්‍රධාන වශයෙන් දැක්විය හැකි ය. මේ අතරත් වඳුරන්, ඒප්ස් සහ මිනිසුන් Order Primates)සත්ව කණ්ඩායමට අයත් වේ. "ලෝරිස්" ලාගේ ශාරීරික ලක්‍ෂණ සහ සෙසු වර්ණ ලක්ෂණ අනුව ඔවුන් වර්ග හෙවත් විශේෂ දෙකකට බෙදා දැක්විය හැකි ය.පළමු විශේෂය Lorisiformesවන අතර එම කණ්ඩායමට අයත් සතුන් වශයෙන් ලෝරිස් (Loris)පොටෝ(Potto)සහ ගලාගෝ(Galago)ලෙසින් ද දෙවන විශේෂය(Lemuriformes) වශයෙන් ද සඳහන් කළ හැකි ය. මෙම විශේෂයට සිපාකා (Sifaka) aye aye Indriසහavaniවැනි සත්ව කණ්ඩායම් අයත් වේ.

පොදුවේ ගත්විට නිශාචර සත්ව කොට්ඨාශයක් වන ලෝරිස් වර්ග කිහිපයකි. සත්ව ලෝකය තුළ දී යොවුන්Slenter LorisසහSlow Lorisවශයෙන් මොවුන් හඳුන්වනු ලබති. විශේෂයෙන් ම Slenter Lorisගේ නිජබිම ශ්‍රී ලංකාව සහ දකුණු ඉන්දීය ප්‍රදේශ වශයෙන් සඳහන් කළ හැකි ය. මෙම විශේෂය ලෝකයේ වෙනත් කිසිදු ප්‍රදේශයකින් සොයා ගැනීමට වර්තමානය දක්වාම නොහැකි වීම

ශ්‍රී ලාංකිකයන් වන අපට ද ආඩම්බර විය හැකි සුවිශේෂී තත්ත්වයකි. තවද, Slenter Loris එක් විශේෂයක් පමණක් දැකිය හැකි වුවත් Slow Lorisවිශේෂ කිහිපයකි. මොවුන් සත්ව විද්‍යාත්මකව Nycticebus Coucang සහ Nycticebus Pygmaeus ලෙසින් හඳුන්වා තිබේ. මෙකී "ලෝරිස්" සත්ව විශේෂ දෙකම දකුණු නැගෙනහිර ආසියාවේදී හා මාලදිවයින තුළ දී පමණක් දැකගත හැකි ය.



සෙසු සත්වයන්ට හාත්පසින් ම වෙනස් ලිංගික ක්‍රියාවලියක් පැටවුන් බෝ කිරීම සඳහා ලෝරිස්ලා විසින් අනුගමනය කරනු ලබයි. සත්‍ය වශයෙන් ම ලෝරිස්ලා සඳහා ලිංගික කාර්යන්ට නියමිත රටාවක් නොමැති බව පැවසීම නිවැරදි ය. කෙසේ වුවත් මොවුන්ගේ ලිංගික කාර්යය සඳහා විනාඩි 300 ක පමණ කාල අවශ්‍ය වේ.

පළමු විශේෂය නම් Slenter Lorisකුඩා නිශාචර සත්වයෙකි. ඇතැම් විට ලේනෙකුට (SQuirrel)වඩා කුඩා ස්වරූපයක් ගනී. මොවුන්ගේ ශරීරය අඟල් 7 – 8 ගණන දිග වේ. තවද මොවුන්ගේ පාද සහ අත්වල ඇඟිලි පහක් දැකිය හැකි අතර ම ඉතා හොඳින් වැඩුණු නිය කැපී පෙනේ. නිය නිසා ගස් මත නොවැටී දැඩිව අල්ලා ගැනීමට මහත් උපකාරී වෙයි. මේ සමගම Slenter Lorisගේ මතක ශක්තිය (Memory Power)සුවිශේෂී ලක්ෂණයකි. එනම් සත්ව විද්‍යාඥයන්ට අනුව මොවුන්ට සීතල මොළයක් පිහිටා තිබේ. එහෙත් ගඳ සුවඳ දැනීම ඉතාම දුර්වල තත්ත්වයකි. කෙසේ වෙතත් ඉතා ම විශාල සහ තියුණු ඇස් පිහිටා තිබීම සෙසු ක්ෂීරපායී සතුන්ට වඩා පහසුවෙන් ගොදුරු අල්ලා ගැනීමට "ලෝරිස්" ලාට පහසු කටයුත්තකි. එනම් විශේෂයෙන් ම මොවුන්ගේ දෑස් වෙතින් ආලෝක සඳහා ප්‍රතිචාර දැක්වීම සුවිශේෂී තත්ත්වයකි. තවද, ඉතාම විශාල ඇස් සමීපව පිහිටා තිබීම තුළින් ගොදුරක් දුටු විගස නිවැරදිව තීරණය කර ගැනීමට මෙන්ම ගොදුර වෙතම නෙත් යොමු කිරීමට ද හැකියාවක් තිබේ.

කෙසේ වුවත් සෙසු ක්ෂීරපායී සතුන් මෙන් නොව ලෝරිස්ලාගේ පෝෂණය රටාව ද වෙනස් ස්වරූපයක් ගනී. Slenter Lorisගේ ආහාර දමය විවිධාකාර ය. සත්ව විද්‍යාඥයින්ගේ මතය නම් විවිධාකාර Slenter Lorisවිසින් ප්‍රයෝජනයට ගන්නා බවයි. එහෙත් සාමාන්‍යයෙන් මොවුන් මස් සහ ශාක වර්ග ආහාරයට ගන්නා Comnivoresසතුන් ලෙස පිළිගනී. එහෙත් ශ්‍රී ලංකාවේ වාසය කරන Slenter Lorisප්‍රධාන වශයෙන් කෘමින් පමණක් ආහාරයට ගන්නා බවට මතයක් පවතී. එම නිසා මොවුන් Insectivecresලෙසින් නම් කිරීමට සත්ව විද්‍යාඥයන් කැමැත්තක් දක්වන බව ඔවුන්ගේ චරිතා තුළින් කැපී පෙනෙන සුවිශේෂී ලක්ෂණයකි. ඒ අනුව Slenter Lorisවිසින් තණකොළ පෙත්තන්, මී මැස්සන්, වේයන් සහ සමනලුන් වැනි සතුන් කැලෑ තුළ දී ආහාරයට ගනු ලබයි. තවද, පුංචි කුරුල්ලන්, කටුස්සන්, ගස් ගෙම්බන් වැනි සතුන් ද ගොදුරු කර ගත් මුත් කිසිම විටෙක කුඩා ක්ෂීරපායී සතුන් ආහාරයට නොගනී. මේ සමගම මිදි, අඹ, ගස්ලබු, කෙසෙල් ගෙඩි, වැනි පලතුරු ද දකුණු ඉන්දීය Slenter Lorisගනු ලැබුව ද ශ්‍රී ලංකාවේ දී දැකිය හැක්කේ ඔවුන් වරකා පමණක් බුදින ලෝරිස්ලා පමණකි.

මගේත් "ලෝරිස්" පොදු සත්ව කණ්ඩායමේ දෙවන විශේෂය වනSlow Lorisගේ ජීවන ඔවුන්ට Slenter Lorisට වඩා හාත් පසින් ම වෙනස් ස්වරයක් දැකිය හැකි ය. විශේෂයෙන් ම Nycticebus Coucong Slow Lorisගේ ශරීරය කුඩා හාවකුට සමාන වන අතර ම හිසේ සිට ශරීරය අඟල් 10 – 5 – 15 අතර ප්‍රමාණයක් වේ. සාමාන්‍ය බර කිලෝ ග්‍රෑම් 1.5 ප්‍රමාණයක වන බවට මත බොහොමයක් තිබේ. මොවුන්ගේ එම ලක්ෂණයටත් වඩා වැදගත් වන්නේ ශරීර වර්ණය වේ. එහි ශරීරය පුරා අළු පැහැති මිශ්‍ර සුදු වර්ණයක් දැකිය හැකි අතර ඇස්වටා තද පැහැති රවුම් හෙවත් රටා වළලු ඉතාමත් සිත්ගන්නා සුළුයි. මෙවැනි ලක්ෂණ ගනු ලබන Slow Lorisදකුණු නැගෙනහිර ආසියාවේ සහ බටහිර ඉන්දුනිසියාවේදී දැකිය හැකි ය.

තවද, මොවුන්ගේ ජීවන රටාව ඉතාමත් සිත් ගන්නා සුළු ය. එනම් සෙසු සත්වයන් මෙන් නොවුවත් මොවුන් රාත්‍රි කාලය තුළ දී පමණක් ක්‍රියාශීලි වීම නිසා ය. කෙසේ වුවත්, පොදුවේ මොවුන් තනිව වාසය කරන අතර ආහාර සොයා ගැනීම පිණිස ඉතාමත් සෙමින් අතු පතර සංචාරය කිරීම දැකගත හැකි ය. විශේෂයෙන් ම සර්මකලාපීය හරිතාගාර වනාන්තර තුළ දී දැක ගැනීමට හැකි වීම සුලබ තත්ත්වයකි. එහෙත් Slenter Lorisට වඩා ප්‍රධාන වශයෙන් මොවුන්ගේ අහාර ගැනීම වෙනස් වේ. එනම් පිළිතුර මත යැපීමට ඉතඩඹ තඩපඩඑ රුචිකත්වයක් දක්වති. එහෙත් ඉතාම කලාතුරකින් හෝ කෘමීන් සහ කුරුලු බිත්තර ගිල දැමීමට ද රුසියෝ වෙති. සත්ව විද්‍යාඥයන්ට හා පර්යේෂකයින්ට අනුව පොදුවේ ලෝරිස්ගාගේ වර්ත ලක්ෂණතා හඳුනා ගැනීම ඉතාම අපහසු කාර්යයකි. මුළු රාත්‍රිය පුරා ම ආහාර සොයමින් ගමන් ගන්නා මොවුන් විශේෂයෙන් ම පිරිමි සතුන් බොහෝ නිට ගැහැනු සතුන් කිහිප දෙනෙකු සමග ලිංගිකව හැසිරීම සුලභ දර්ශණණයකි. බොහෝ නිශාචර සතුන් මෙන් ලෝරිස්ලා ද මුත්‍රා සලකුණු මගින් අනෙක් ලෝරිස්ලාට ලිංගික කාර්යයන් සඳහා යම් ඉඟියක් ලබාදෙනු ලබයි.

එහෙත් Slow Loris විශේෂයෙන් දෙවන කොට්ඨාශය වන Pygmy Slow Loris සහ Slow Lorisඅතර වෙනස්කම් රාශියක් දැකිය හැකි ය. ඔවුන් දඬුලේනකුගේ ශරීර ප්‍රමාණය ගන්නා අතර දිග අඟල් 6 – 10 අතර ප්‍රමාණයක් වේ. බර ප්‍රමාණය ඇතැම් විට කිලෝවටත් වඩා අඩු ය. මෙම වර්ගයේ ලෝරිස්Slenter Lorisවඩා ශරීර වර්ණය ඉතාමත් සිත්ගන්නා සුළු ය. සමේ පැහැය දීප්තිමත් තැඹිලි ගුරු පැහැයෙන් ගනු ලබයි. එහෙත් ප්‍රධාන වශයෙන් සඳහන් කල හැකි කරුණක් නම් මොවුන් කුඩා ක්ෂීරපායි සතුන් ද ආහාරයට ගැනීම වේ. Pygmy Slow Lorisඉතාමත් කඩිසර ස්වාභාවයක් ගැනීම ද නවත් සුවිශේෂි කරුණකි. මොවුන්ගේ සෙසු ක්‍රියාකාරකම් Slenter Lorisට සමාන වුවද, රාත්‍රි කාලය පුරා ම නිසංසලව ගමන් කිරීම වෙනුවට කඩිසර කමින් ආහාර හොයා ගැනීම සුවිශේෂි කරුණක් වේ.

කෙසේ වුවත්, සුළු ලෝරිස් විශේෂය තම ලිංගික චර්යාවන් පොදු ස්වභාවයක් දැකිය හැකි ය. විශේෂයෙන් ලිංගික කාලසීමාවන් පැටවුන් බිහි කිරීම, පැටවුන් පෝෂණය ආදී කාර්යයන් තුළ දී මෙම ස්වභාවය කැපී පෙනෙයි. සෙසු සත්වයන්ට හාත්පසින් ම වෙනස් ලිංගික ක්‍රියාවලියක් පැටවුන් බෝ කිරීම සඳහා ලෝරිස්ලා විසින් අනුගමනය කරනු ලබයි. සත්‍ය වශයෙන් ම ලෝරිස්ලා සඳහා ලිංගික කාර්යන්ට නියමිත රටාවක් නොමැති බව පැවසීම නිවැරදි ය. කෙසේ වුවත් මොවුන්ගේ ලිංගික කාර්යය සඳහා විනාඩි 300 ක පමණ කාල අවශ්‍ය වේ.

38 පිටුවට

# දවල් නිදන රෑ නොනිදන...

36 පිටුවෙන්

සාමාන්‍යයෙන් නව පැටවෙකු බිහි කිරීම සඳහා දින 170 ක් පමණ කාලයක් පසු කිරීමට සිදු වේ. බොහෝ විට පැටවුන් බිහි කිරීම මාර්තු , අප්‍රියෙල් සහ මැයි යන මාස තුළ දී දැකිය හැකි ය. සෙසු සත්වයන් මෙන් නොව ලෝරිස්ලා විවෘත ස්ථානයක දහවල් කාලයේ දී පැටවුන් බිහි කිරීම සිදු කරයි. නව පැටවා සති 5 – 7 කාල සීමාවක් සිය මව සමග වාසය කරන අතරම පැය 2 – 3 කට පසුව කෙටි දුරක් සිය පැටවා මව විසින් ඔසවාගෙන යනු ලබයි. එමෙන් ම පුරුද්දක් ලෙස මව විසින් කුඩා පැටවාගේ පසු පස ගමන් කරමින් ඔවුනට ආරක්ෂාව සැපයීම සාමාන්‍ය ලක්ෂණයකි.

කුමන ආකාරයකට සටහන් කළත්, සෙසු සත්වයින්ට වඩා වඳ වීමේ තර්ජනයට මුහුණ පා සිටින සතුන් අතරින් ලෝරිස්ට හිමි වනුයේ ප්‍රමුඛ ස්ථානය යි. මේ සඳහා සුවිශේෂී කරුණක් මැයෙන් සත්ව විද්‍යාඥයන් දක්වන්නේ සෙසු සත්වයින්ට වඩා මොවුන්ගේ ජීවන රටාව පොදු වේ වෙනස් ස්වරූපයක් ගැනීම වේ. අනෙක් අතට ශ්‍රී ලංකාව, ඉන්දියාව සහ මාලදිවයින ආදී රටවල් කිහිපයක පමණක් මොවුන්ගේ නිජ භූමිය වී පැවතීම ද වඳ වීමේ තර්ජනයට රුකුලක් වී තිබෙන බව යි. තවද, ඉන්දියාව මෙම සුළු රටකින් ම ප්‍රමුඛස්ථානය ගනු ලබයි. "ලෝරිස්" ලා ඉන්දීය වෙළඳුන්ට කදිම ආදායම් මාර්ගයකි. ඉන්දීය වෙළඳුන් විසින් "ලෝරිස්" සුරතල් සතකු ලෙසින් ද ආයුර්වේද ඖෂධයක් ලෙසින් ද ඉන්දියන් සමාජයට හඳුන්වා දී තිබේ. එසේ ම ඔහු ආගම්වාදී රටක් වන ඉන්දියාවේදී "ලෝරිස්" ගේ ඇස් යක්ෂ ඇස් ලෙස සලකා තබා ගැනීමට මිනිසුන් විසින් උත්සාහ ගැනීම ද "ලෝරිස්" ලාට ස්වභාවධර්මයා විසින් ලබා දුන් වැනි ය. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවට පමණක් ආවේණික Slenter Lorisරැක ගැනීමට හැකි සුළු පියවරක් ම ගැනීම අනාගත පරපුරට ලබා දිය හැකි ජෛව විවිධත්වයේ පරම ශේෂය ලෝරිස් විය හැකි ය. ❑